සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

25851

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**22 | S | III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010

| | | |
|---|---|---|
| භූගෝල විද්‍යාව | III (මානුෂ භූගෝල විද්‍යාව) | පැය තුනයි |
| புவியியல் | III (மானிடப் புவியியல்) | மூன்று மணித்தியாலம் |
| **Geography** | **III (Human Geography)** | Three hours |

විභාග අංකය ................................

**අයදුම්කරුවන්ට උපදෙස් :**
- මෙම ප්‍රශ්න පත්‍රය I හා II යනුවෙන් කොටස් **දෙකකින්** යුක්ත ය.
- කොටස් දෙකට ම කාලය **පැය තුනකි.**
- I හා II කොටස් **එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා** භාර දෙන්න.

## I කොටස

* I කොටසෙහි බහුවරණ ප්‍රශ්න **40** ක් ඇත.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු ය. නිවැරදි පිළිතුරකට **එක් ලකුණක්** හිමි වේ.
* එක් එක් ප්‍රශ්නයට පිළිතුරු **හතර** බැගින් සපයා ඇත. මේවා අතුරෙන් **නිවැරදි පිළිතුර තෝරා, එට අදාළ අංකය තිත් ඉර මත ලියන්න.**
* **පිළිතුරු ලකුණු කිරීම සඳහා පැන්සල් භාවිත කිරීම තහනම් වේ.**

1. ප්‍රමාණාත්මක භූගෝල විද්‍යාවේ දර්ශනික පදනම සවිමත් කිරීම සඳහා දායක වූ වැදගත් භූගෝල විද්‍යාඥයින් දෙදෙනකු වූයේ
   (1) හාර්ට්ෂෝන් සහ ඩබ්. ඇම්. ඩේවිස් ය.
   (2) හාර්ට්ෂෝන් සහ ඩඩ්ලි ස්ටැම්ප් ය.
   (3) රිචඩ් මෝර්ලි සහ පීටර් ගුල්ඩ් ය.
   (4) පීටර් හැගට් සහ රිචඩ් මෝර්ලි ය. (.........)

2. 2002 වසරේ දී වියපත්වීම පිළිබඳ ජගත් සමුළුව පවත්වනු ලැබුවේ
   (1) පැරිස්හි ය.
   (2) මැඩ්රිඩ්හි ය.
   (3) හෙල්සිංකිහි ය.
   (4) බ්‍රසල්ස්හි ය. (.........)

3. ලෝකයේ ස්වාභාවික ගෑස් සංචිතයන්ගේ සියයට 50 කට වැඩි ප්‍රමාණයකට රටවල් හතරක් වග කියයි. පහත සඳහන් පිළිතුරු අතුරෙන් කවර පිළිතුර එය නිවැරදි ලෙස දක්වා තිබේ ද?
   (1) ඉරානය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඇල්ජීරියාව, රුසියාව
   (2) ඉන්දියාව, රුසියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉරානය
   (3) ඇමෙරිකා එක්සත් ජනපදය, රුසියාව, කැනඩාව, ඉරාකය
   (4) එක්සත් රාජධානිය, ඇමෙරිකා එක්සත් ජනපදය, රුසියාව, කුවේට් (.........)

4. 1936 වසරේදී, ලෝකයෙහි ප්‍රථම කෘෂිකාර්මික වර්ගීකරණය ඉදිරිපත් කරනු ලැබුවේ
   (1) ග්‍රිෆිත් ටේලර් විසිනි.
   (2) ඕ. ඊ. බේකර් විසිනි.
   (3) ඩී. විට්ල්සි විසිනි.
   (4) බී. එච්. ෆාමර් විසිනි. (.........)

5. "ටෝංයා" ක්‍රමයට වන වගාව 1856 දී ප්‍රථමයෙන් හඳුන්වා දෙනු ලැබුවේ
   (1) මියන්මාරයේ ය.
   (2) මැලේසියාවේ ය.
   (3) ඉන්දුනීසියාවේ ය.
   (4) ශ්‍රී ලංකාවේ ය. (.........)

6. 2009 වර්ෂයෙහි ලෝකයේ වැඩිම ප්‍රමාණයක් කපු නිෂ්පාදනය කළ රටවල් (**අවරෝහණ ක්‍රමයට**) කවරේ ද?
   (1) ඇමෙරිකා එක්සත් ජනපදය, උස්බෙකිස්තානය, බ්‍රසීලය සහ පකිස්ථානය
   (2) චීනය, ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය සහ පකිස්ථානය
   (3) ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, පකිස්ථානය සහ බ්‍රසීලය
   (4) චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව සහ පකිස්ථානය (.........)

[ දෙවෙනි පිටුව බලන්න.

7. උජාමා හා කිබුට්ස් යනු
(1) රේඛීය ජනාවාස වේ. (2) විකීර්ණ ජනාවාස වේ.
(3) 'වියළි ලක්ෂ්‍ය' ජනාවාස වේ. (4) න්‍යෂ්ටිගත ජනාවාස වේ. (.........)


8. 'ධාරවි' නමින් හඳුන්වනු ලබන්නේ
(1) මුම්බායිහි මුඩුක්කු ප්‍රදේශයකි.
(2) නවදිල්ලියෙහි අනවසර පැල්පත් වාසීන්ගේ ජනාවාසයකි.
(3) ඩකාහි සේවා හා ඉඩම් කට්ටි ව්‍යාපෘතියකි.
(4) කොල්කටාහි උස් තට්ටු ගොඩනැගිලි සංකීර්ණයකි. (.........)

9. අඩු ආදායම් කණ්ඩායම් සඳහා නිර්මාණය කර ඇති "ඩැන්ඩෝරා" නමැති ජනාවාසය තිබෙන්නේ
(1) ඩොඩෝමාහි ය. (2) නයිරෝබියෙහි ය.
(3) ලුසාකාහි ය. (4) කැම්පාලාහි ය. (.........)

10. සැන්සැන් හා පිට්ස් යන මෙගලොපොලිස් පිහිටා ඇත්තේ
(1) ජපානයෙහි ය. (2) බ්‍රසීලයෙහි ය.
(3) ඇමෙරිකා එක්සත් ජනපදයෙහි ය. (4) ජර්මනියෙහි ය. (.........)

11. එක්සත් ජාතීන්ගේ ලෝක ජනාවාස කේන්ද්‍රයෙහි (UN HABITAT) ප්‍රධාන අරමුණ වන්නේ,
(1) සංවර්ධනය අඩු ප්‍රදේශවල නව නගර පිහිටුවීමට අරමුදල් සැපයීම ය.
(2) යුද්ධයෙන් අවතැන් වූවන් නැවත පදිංචි කරවීමට සහාය වීම ය.
(3) ශුෂ්ක ප්‍රදේශයන්හි ජනපද යෝජනා ක්‍රම පිහිටුවීම ය.
(4) සැමට ප්‍රමාණවත් සෙවනක් සැපයීම ය. (.........)

12. ජපානයේ සිතියමෙහි *A*, *B*, *C*, *D* යනුවෙන් කාර්මික මධ්‍යස්ථාන හතරක් දක්වා ඇත. පහත සඳහන් පිළිතුරු අතුරෙන් ඒවා නිවැරදි ලෙස දක්වා ඇත්තේ කවර පිළිතුරෙහි ද?




(1) (*A*) යොකොහාමා (*B*) ඕසකා
(*C*) කියෝටෝ (*D*) හිටාචි
(2) (*A*) හිටාචි (*B*) යොකොහාමා
(*C*) කියෝටෝ (*D*) ඕසකා
(3) (*A*) ඕසකා (*B*) හිටාචි
(*C*) යොකොහාමා (*D*) කියෝටෝ
(4) (*A*) යොකොහාමා (*B*) කියෝටෝ
(*C*) ඕසකා (*D*) හිටාචි (.........)

13. ජැම්ෂෙඩ්පූර් හා භද්‍රවතී යන ඉන්දියානු යකඩ හා වානේ නිෂ්පාදන මධ්‍යස්ථාන පිහිටා ඇත්තේ පිළිවෙළින්
(1) බටහිර බෙංගාලය හා මහාරාෂ්ට්‍ර යන ප්‍රාන්තවල ය.
(2) බිහාර් හා කර්නාටක ප්‍රාන්තවල ය.
(3) මධ්‍ය ප්‍රදේශ් හා තමිල්නාඩු යන ප්‍රාන්තවල ය.
(4) බිහාර් හා ආන්ද්‍ර ප්‍රදේශ් යන ප්‍රාන්තවල ය. (.........)

14. වර්තමාන ලෝකයේ වානේ නිෂ්පාදනය කරන ප්‍රධාන රටවල් **(අවරෝහණ පිළිවෙළට)** වනුයේ
(1) ජපානය, එක්සත් රාජධානිය හා ඇමෙරිකා එක්සත් ජනපදයයි.
(2) ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය හා චීනයයි.
(3) චීනය, ජපානය හා යුරෝපා හවුලයි.
(4) යුරෝපා හවුල, ඇමෙරිකා එක්සත් ජනපදය හා කැනඩාවයි. (.........)


[ තුන්වෙනි පිටුව බලන්න.

15. ගුවන් යානා නිෂ්පාදනය සඳහා වැදගත් වන මධ්‍යස්ථාන තුනක් වනුයේ,
   (1) කිව්, ලොස් ඇන්ජලීස් හා හැම්බර්ග් ය.
   (2) රොස්ටෝ, ලන්ඩන් හා චිකාගෝ ය.
   (3) බැංගලෝර්, පිට්ස්බර්ග් හා කොවෙන්ට්‍රි ය.
   (4) රොස්ටෝ, ලන්ඩන් හා සැන් ඩියේගෝ ය.
(………)

16. 2008 වසරේ දී, දසලක්ෂ 10 ට අධික ජන සංඛ්‍යාවක් වාර්තා කළ ආසියානු නගර හතරක ජන සංඛ්‍යාව පහත දක්වේ. (මිලියන වලින්)
   (A) 15.6   (B) 11.4   (C) 13.6   (D) 11.0
මෙම ජන සංඛ්‍යාවන් පැවැති නගර නිවැරදි ලෙස ඉහත දක්වෙන අනුපිළිවෙළින් හඳුනාගත හැක්කේ පහත සඳහන් කවර පිළිතුරෙහි ද?
   (1) (A) බේජිං   (B) ඩැකා   (C) ඔසකා   (D) දිල්ලිය
   (2) (A) බේජිං   (B) දිල්ලිය   (C) ඩැකා   (D) ඔසකා
   (3) (A) දිල්ලිය   (B) බේජිං   (C) ඩැකා   (D) ඔසකා
   (4) (A) ඩැකා   (B) බේජිං   (C) දිල්ලිය   (D) ඔසකා
(………)

17. 2009 ලෝක ආර්ථික සමුළුව පවත්වනු ලැබුයේ කිනම් නගරයේ ද?
   (1) පැරිස්   (2) ඩාවෝස්   (3) ජිනීවා   (4) රෝමය
(………)

18. ඉන්දියාවේ සිතියමෙහි, වැදගත් කාර්මික මධ්‍යස්ථාන හතරක් *A, B, C, D* යනුවෙන් ලකුණු කොට ඇත. ඒවා නිවැරදි ලෙස හඳුනාගෙන ඇත්තේ, පහත සඳහන් පිළිතුරු අතුරෙන් කවර පිළිතුරෙහි ද?




   (1) (*A*) අහමදාබාද්   (*B*) මුම්බායි   (*C*) ඉන්දෝර්   (*D*) හයිද්‍රබාද්
   (2) (*A*) මුම්බායි   (*B*) අහමදාබාද්   (*C*) හයිද්‍රබාද්   (*D*) ඉන්දෝර්
   (3) (*A*) අහමදාබාද්   (*B*) ඉන්දෝර්   (*C*) මුම්බායි   (*D*) හයිද්‍රබාද්
   (4) (*A*) ඉන්දෝර්   (*B*) හයිද්‍රබාද්   (*C*) අහමදාබාද්   (*D*) මුම්බායි
(………)

The National e-Learning Portal for The General Education

19. බිම්ස්ටෙක් සංවිධානයට අයත් රටවල් හතරක් වනුයේ
   (1) බංග්ලාදේශය, මැලේසියාව, තායිලන්තය සහ මාලදිවයිනයි.
   (2) මියන්මාරය, මැලේසියාව, ඉන්දුනීසියාව සහ ශ්‍රී ලංකාවයි.
   (3) පකිස්ථානය, මාලදිවයින, මැලේසියාව සහ බංග්ලාදේශයයි.
   (4) ඉන්දියාව, ශ්‍රී ලංකාව, භූතානය සහ නේපාලයයි.
(………)

20. ලෝකයේ මෝටර් රථ නිෂ්පාදනයේ දී පෙරමුණ ගෙන ඇති රටවල් හතර, **ආරෝහණ ක්‍රමයට** නම් කොට ඇත්තේ, පහත සඳහන් පිළිතුරු අතුරෙන් කවර පිළිතුරෙහි ද?
   (1) ජර්මනිය, ඇමෙරිකා එක්සත් ජනපදය, චීනය සහ ජපානය
   (2) චීනය, ජර්මනිය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ජපානය
   (3) ඇමෙරිකා එක්සත් ජනපදය, චීනය, ජර්මනිය සහ ජපානය
   (4) ජර්මනිය, ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය සහ චීනය
(………)

21. ලෝකයේ ප්‍රධානතම තාක්ෂණික නවීකරණ මධ්‍යස්ථාන 10 අතුරෙන් සංවර්ධනය වන රටක පිහිටා ඇති එකම මධ්‍යස්ථානය වනුයේ
   (1) කරච්චි ය.   (2) බැංගලෝර් (බෙංගලූරු) ය.
   (3) කයිරෝ ය.   (4) බුවනොස් අයර්ස් ය.
(………)

22. ලෝකයේ පල්ප හා කඩදාසි නිෂ්පාදනයෙන් හරි අඩක් ම සංකේන්ද්‍රණය වී ඇති රටවල් කවරේ ද?
   (1) චීනය, ජපානය, ෆින්ලන්තය සහ ස්වීඩනය.
   (2) ඇමෙරිකා එක්සත් ජනපදය, චීනය, ජපානය සහ ජර්මනිය.
   (3) ස්වීඩනය, එක්සත් රාජධානිය, ජපානය සහ ඉන්දුනීසියාව.
   (4) ඉන්දුනීසියාව, නෝර්වේ, දකුණු කොරියාව සහ චීනය
(………)

[ හතරවෙනි පිටුව බලන්න.

25851

23. ඇමෙරිකා එක්සත් ජනපදයේ තිරිඟු සහ ඉරිඟු සම්බන්ධයෙන් අධිකතම නිෂ්පාදනය පිළිවෙළින් වාර්තා කෙරෙන ජනපද දෙක නම්

(1) නෙබ්‍රස්කා සහ මිසූරි (2) ටෙක්සාස් සහ අයිඩහෝ
(3) කැන්සාස් සහ අයෝවා (4) කැන්සාස් සහ ඔක්ලහෝමා (.........)

24. ලෝකයේ කිරි ද්‍රව්‍ය **නිෂ්පාදනය කරන**, **අපනයනය කරන** හා **ආනයනය කරන** ප්‍රධාන රටවල් **පිළිවෙළින්** දක්වෙන පිළිතුර තෝරන්න.

(1) ඩෙන්මාර්කය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඉන්දියාව
(2) නවසීලන්තය, ඇමෙරිකා එක්සත් ජනපදය සහ ඉන්දියාව
(3) ඉන්දියාව, නවසීලන්තය සහ ජපානය
(4) නවසීලන්තය, නවසීලන්තය සහ ඇමෙරිකා එක්සත් ජනපදය (.........)

25. මසායි හා හොටෙන්ටොට් යන සංචාරක එඬේරුන් ජීවත් වනුයේ

(1) උතුරු නයිජීරියාවෙහි හා උතුරු ඉතියෝපියාවෙහි ය.
(2) උතුරු උගන්ඩාවේ හා දකුණු සුඩානයෙහි ය.
(3) නැගෙනහිර කැමරූන්හි හා දකුණු වැඩ්හි ය.
(4) දකුණු කෙන්යාවේ හා උතුරු ටැංසේනියාවෙහි ය. (.........)

26. පුරවර ප්‍රදේශයක් යනු

(1) මහ නගර හා නගර ඇති ආකීර්ණයකි.
(2) රටක පරිපාලන අගනුවරකි.
(3) මධ්‍යම නගරය, උප නගර, වෙනත් නගර හා ගැමිරික ජනාවාස වලින් සමන්විත කලාපයකි.
(4) මහ නගර, උප නගර හා ග්‍රාමීය ප්‍රදේශ ඇතුළත් ආකීර්ණයකි. (.........)


27. වර්තමාන ලෝකයේ මත්ස්‍ය කර්මාන්තයෙහි යෙදෙන ප්‍රධාන රටවල් තුන වනුයේ,

(1) ඇමෙරිකා එක්සත් ජනපදය, ජපානය හා එක්සත් රාජධානියයි.
(2) චීනය, පේරු හා ඇමෙරිකා එක්සත් ජනපදයයි.
(3) චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය හා එක්සත් රාජධානියයි.
(4) චීනය, ජපානය හා එක්සත් රාජධානියයි. (.........)

28. 2008 වර්ෂයේ දී මුළු ජනසංඛ්‍යාවෙන් අධිකතම (29.0%) ප්‍රමාණයක් මන්දපෝෂණයෙන් පෙළෙන ජනකායක් වසන ප්‍රදේශයෙහි නම නිවැරදිව දක්වෙන පිළිතුර වනුයේ

(1) උප සහරා අප්‍රිකාව (2) දකුණු ආසියාව
(3) නැගෙනහිර ආසියාව (4) කැරිබියානු රටවල් (.........)

29. බ්‍රිතාන්‍ය සිතියමෙහි, වැදගත් කාර්මික මධ්‍යස්ථාන හතරක් *A*, *B*, *C*, *D* යනුවෙන් ලකුණු කොට ඇත. ඒවා නිවැරදි ලෙස හඳුනාගත හැක්කේ පහත දක්වෙන පිළිතුරු අතුරෙන් කවර පිළිතුරෙහි ද?




(1) (*A*) ලිවර්පූල් (*B*) බර්මිංහම්
(*C*) නිව් කාසල් (*D*) ග්ලාස්ගෝ

(2) (*A*) බර්මිංහම් (*B*) ලිවර්පූල්
(*C*) නිව් කාසල් (*D*) ග්ලාස්ගෝ

(3) (*A*) ලිවර්පූල් (*B*) ග්ලාස්ගෝ
(*C*) නිව් කාසල් (*D*) බර්මිංහම්

(4) (*A*) බර්මිංහම් (*B*) නිව් කාසල්
(*C*) ලිවර්පූල් (*D*) ග්ලාස්ගෝ (.........)

30. 2009 වර්ෂයේ දී ශ්‍රී ලංකාව පරදවා විශාල වශයෙන් තේ අපනයනකරුවකු වශයෙන් ප්‍රමුඛස්ථානයක් ලැබූ රට

(1) ටැංසේනියාවයි. (2) ඉන්දියාවයි.
(3) චීනයයි. (4) කෙන්යාවයි. (.........)

31. "බ්ලිස්ටර් බ්ලයිට්" (Blister Blight) යනුවෙන් ශ්‍රී ලංකාවේ හඳුන්වනු ලැබූ රෝගය කුමන බෝගයට බලපෑවේ ද?

(1) තේ (2) රබර්
(3) කෝපි (4) පොල් (.........)

32. ශ්‍රී ලංකාවේ "නිෂ්පාදන දශකය" ලෙස ප්‍රකාශ කරනු ලැබුවේ කවර දශකය ද?
(1) 1996 - 2005 (2) 1997 - 2006 (3) 1998 - 2007 (4) 1999 - 2008 (………)


33. ශ්‍රී ලංකාවේ කෘෂි ළිං වැඩිම සංඛ්‍යාවක් තනා ඇති දිස්ත්‍රික්ක දෙක වනුයේ
(1) අනුරාධපුරය හා පුත්තලමයි. (2) පොළොන්නරුව හා වවුනියාවයි.
(3) අනුරාධපුරය හා කුරුණෑගලයි. (4) මාතලේ හා වවුනියාවයි. (………)

34. ශ්‍රී ලංකාවේ ජෛව ස්කන්ධ, බලශක්ති මූලයක් වශයෙන් යොදා ගන්නා කර්මාන්ත තුන **අවරෝහණ** පිළිවෙළට දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) ගඩොල් කර්මාන්තය, තේ නිෂ්පාදනය, උළු කර්මාන්තය.
(2) තේ නිෂ්පාදනය, රබර් නිෂ්පාදනය, උළු කර්මාන්තය.
(3) උළු කර්මාන්තය, ගඩොල් කර්මාන්තය, තේ නිෂ්පාදනය.
(4) ගඩොල් කර්මාන්තය, උළු කර්මාන්තය, තේ නිෂ්පාදනය. (………)

35. මීටියාගොඩ, එප්පාවල සහ පුල්මුඩෙයිහි ඇති ඛනිජ සම්පත් අනුපිළිවෙළින් දක්වා ඇත්තේ පහත සඳහන් පිළිතුරු අතුරෙන් කවර පිළිතුරෙහි ද?
(1) ඇපටයිට්, මිනිරන් සහ පිඟන් මැටි (2) ඛනිජ වැලි, ඇපටයිට් සහ පිඟන් මැටි
(3) පිඟන් මැටි, ඛනිජ වැලි සහ මිනිරන් (4) පිඟන් මැටි, ඇපටයිට් සහ ඛනිජ වැලි (………)

36. ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2008 දී සපයන ලද දත්ත අනුව ශ්‍රී ලංකාවේ ජල විදුලි බලය හා තාප විදුලි බලය අතර 2007 දී පැවති අනුපාතය
(1) 49.4% : 50.6% වි ය. (2) 40.2% : 59.8% විය.
(3) 35.1% : 64.9% විය. (4) 69.9% : 30.1% විය. (………)

37. සංචාරකයින් ආකර්ෂණය කරන ශ්‍රී ලංකාවේ වැදගත් වෙරළබඩ ස්ථාන තුනක් (*A*), (*B*) හා (*C*) වශයෙන් සපයා ඇති සිතියමේ ලකුණු කර ඇත. මේ මධ්‍යස්ථාන නිවැරදිව නම් කර ඇති පිළිතුර තෝරන්න.




(1) (*A*) ආරුගම් බොක්ක
(*B*) කුඩාවැල්ලේ හුම්මානය
(*C*) පාසිකුඩා
(2) (*A*) ත්‍රිකුණාමල බොක්ක
(*B*) කුමන
(*C*) නිලාවෙලි
(3) (*A*) ආරුගම් බොක්ක
(*B*) බුන්දල
(*C*) නිලාවෙලි
(4) (*A*) කින්නියා
(*B*) බුන්දල
(*C*) පාසිකුඩා (………)

38. 2001 ජන සංගණනයේ දී ශ්‍රී ලංකාවේ 100,000 වැඩි ජනසංඛ්‍යාවක් පැවති නගර තුනක් නිවැරදිව දක්වෙන පිළිතුර තෝරන්න.
(1) ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මහරගම, සීදූව-කටුනායක
(2) මහනුවර, මීගමුව, කල්මුණේ
(3) දෙහිවල-ගල්කිස්ස, මොරටුව, මහනුවර
(4) මොරටුව, ගම්පහ, මීගමුව (………)

39. ශ්‍රී ලංකාව "ඉන්ටර්නෙට්" (Internet) ජාලය හා සම්බන්ධ වූයේ කිනම් වර්ෂයේ දී ද?
(1) 1993 (2) 1994 (3) 1995 (4) 1996 (………)

40. ශ්‍රී ලංකාවේ ප්‍රථම චන්ද්‍රිකා මධ්‍යස්ථානය පිහිටුවනු ලැබුවේ
(1) 1975 වසරේ හෝමාගම ය. (2) 1975 වසරේ කැළණියේ ය.
(3) 1976 වසරේ පැල්මඩුල්ලේ ය. (4) 1976 වසරේ පාදුක්කේ ය. (………)

* *

25851

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

22 S III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010


භූගෝල විද්‍යාව III (මානුෂ භූගෝල විද්‍යාව) (II කොටස)
புவியியல் III (மானிடப் புவியியல்) (பகுதி II)
**Geography III (Human Geography) (Part II)**

**අයදුම්කරුවන්ට උපදෙස් :**

* ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
* දේශපාලන බෙදීම් සහිත ලෝක සිතියම් දෙකක් ප්‍රශ්න අංක **2** සහ **7** සඳහා සපයනු ලැබේ.
* මහවැලි සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශයේ සිතියමක් ප්‍රශ්න අංක **4** සඳහා සපයනු ලැබේ.
* පැහැදිලි අකුරෙන් පිළිතුරු සැපයිය යුතු ය.

1. 1995 සිට 2035 (ඇස්මේන්තු ගත) කාලය සඳහා ආසියාවේ තරුණ (අවුරුදු 15-24 දක්වා) සහ වයස්ගත (අවුරුදු 65 ට වැඩි) ජනසංඛ්‍යාවේ වර්ධන ප්‍රවණතා **අංක 1 රූප සටහන** මගින් දක්වේ. එය අදාළ කොටගෙන පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**අංක 1 රූප සටහන**
**ආසියාවේ ජනසංඛ්‍යා ප්‍රවණතා, 1995 - 2035 (ප්‍රක්ෂේපිත)**




(i) තරුණ හා වයස්ගත ජන සංඛ්‍යා කාණ්ඩ සසඳන විට පැහැදිලි වන ප්‍රධාන ලක්ෂණ **තුනක්** දක්වන්න. *(ලකුණු 03 යි)*

(ii) අවුරුදු 15-24 අතර වයස් කාණ්ඩය සඳහා සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනයේ දී සලකා බැලිය යුතු ප්‍රධාන ගැටළු **තුනක්** සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි)*

(iii) ආසියානු රටවල සමාජ-ආර්ථික සංවර්ධනයේ දී වයස්ගත ජන සංඛ්‍යා කණ්ඩායම සම්බන්ධයෙන් සලකා බැලිය යුතු ගැටළු **හතරක්** විභාග කරන්න. *(ලකුණු 06 යි)*

[ හත්වෙනි පිටුව බලන්න.

2. (i) වර්තමාන ලෝකයේ ස්වාභාවික රබර් නිෂ්පාදනය සඳහා වැදගත්වන රටවල් **හයක්** (ශ්‍රී ලංකාව හැර) අදාළ සිතියමෙහි ලකුණු කොට නම් කරන්න. (ලකුණු 03 යි.)
(ii) සාර්ථක ස්වාභාවික රබර් වගාව සඳහා දායක වන ප්‍රධාන භූගෝලීය සාධක **හතරක්** විස්තර කරන්න. (ලකුණු 06 යි.)
(iii) රබර් සම්බන්ධයෙන්, ජාත්‍යන්තර වෙළෙඳමේ දී පැහැදිලි වන වැදගත් ප්‍රවණතා **තුනක්** හඳුනාගෙන සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි.)

3. (i) ශ්‍රී ලංකාවේ ආර්ථිකය තුළ සුළු අපනයන භෝගයන්හි වැදගත්කම සැකෙවින් සාකච්ඡා කරන්න. (ලකුණු 03 යි.)
(ii) වර්ෂ 1970 න් පසුව, ශ්‍රී ලංකාවේ සුළු අපනයන භෝග වගාව දියුණු කිරීම සඳහා රජය විසින් ලබාදී ඇති දිරි ගැන්වීම් **හතරක්** විභාග කරන්න. (ලකුණු 06 යි.)
(iii) "සුළු අපනයන භෝග සඳහා භෝග-විශේෂිත පාරිසරික සාධක අවශ්‍ය වේ." මෙම ප්‍රකාශය ඇසුරෙන්, කුරුඳු සහ කරදමුංගු වගාව සඳහා අවශ්‍යවන පාරිසරික සාධක **හතරක්** සසඳන්න. (ලකුණු 06 යි.)

4. (i) සපයා ඇති මහවැලි සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශය දක්වන සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න.
(අ) H, C සහ B යන වාරිමාර්ග පද්ධති.
(ආ) රන්දෙනිගල, උල්හිටිය සහ මොරගහකන්ද ජලාශ
(ඉ) තඹුත්තේගම, දෙහිඅත්තකණ්ඩිය, එප්පාවල සහ බකමූණ යන සේවා මධ්‍යස්ථාන (townships) (ලකුණු 05 යි.)

● සපයා ඇති මහවැලි සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශයේ **සිතියමෙහි** හා **වගු අංක 1 හා 2 හි සපයා ඇති තොරතුරු** ද ඔබේ **පසුබිම් දැනුමද** ප්‍රයෝජනයට ගෙන පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) මහවැලි සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශයෙහි පදිංචි කරනු ලැබූ ජනතාවගේ සමාජ හා ආර්ථික සංවර්ධනයෙහි කැපී පෙනෙන ලක්ෂණ විස්තර කරන්න. (ලකුණු 06 යි.)
(iii) ශ්‍රී ලංකාවේ වී නිෂ්පාදනයට සහ බලශක්ති උත්පාදනයට මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය දායක වූ ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි.)

**වගු අංක 1**
**පහළ හා ඉහළ මහවැලි ප්‍රදේශයන්හි ජන සංඛ්‍යාව හා තෝරාගත් කෘෂිකාර්මික කටයුතු, 2007**

| දර්ශකය | මුළු ගණන |
|---|---|
| පදිංචි කරන ලද මුළු පවුල් සංඛ්‍යාව | 106 367 |
| ව්‍යාපෘති ප්‍රදේශයේ ඇස්තමේන්තු ගත මුළු ජනසංඛ්‍යාව | 596 293 |
| වී සහ වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කළ බිම් ප්‍රමාණය* (හෙක්ටයාර) | 162 916 |
| ආහාර නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්) | 1 097 424 |

* 2007 යල කන්නය හා 2006/2007 මහ කන්නය

මූලාශ්‍රය : *Mahaweli Authority of Sri Lanka, Statistical Handbook, 2007* ට අනුව සකස් කරන ලදී.

**වගු අංක 2**
**මහවැලි සංවර්ධන ව්‍යාපෘතියේ වී නිෂ්පාදනය හා බලශක්ති උත්පාදනය සම්බන්ධ තෝරා ගත් දර්ශක, 2007**

| දර්ශකය | ප්‍රතිශතය/ ප්‍රමාණය |
|---|---|
| ජාතික වී වගා බිම් වලින් මහවැලි ප්‍රදේශයන්හි වී වගා බිම් ප්‍රමාණය (%) | 18.10 |
| ජාතික වී නිෂ්පාදනයෙන් මහවැලි ප්‍රදේශයන්හි වී නිෂ්පාදනය (%) | 23.50 |
| මහවැලි ව්‍යාපෘතියේ සාමාන්‍ය වී අස්වැන්න (හෙක්ටයාරයට මෙට්‍රික් ටොන්) | 5.5 |
| ශ්‍රී ලංකාවේ සාමාන්‍ය වී අස්වැන්න (හෙක්ටයාරයට මෙට්‍රික් ටොන්) | 4.3 |
| මුළු ජාතික ජල විදුලි බල නිෂ්පාදනයෙන් මහවැලි ව්‍යාපෘතියේ නිෂ්පාදනය (%) | 49.00 |

මූලාශ්‍රය : *Mahaweli Authority of Sri Lanka, Statistical Handbook, 2007* ට අනුව සකස් කරන ලදී.

5. (i) න්‍යෂ්ටිගත ග්‍රාමීය ජනාවාසයක කැපී පෙනෙන ලක්ෂණ **හතරක්** දක්වන්න. (ලකුණු 02 යි.)
(ii) න්‍යෂ්ටිගත ග්‍රාමීය ජනාවාස වෙනස් වීමට තුඩු දෙන සාධක (නාගරීකරණය හැර) **හතරක්** සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි.)
(iii) ගැමිරික ජනාවාසයන්හි පහත සඳහන් අංශවල සිදුවන **වෙනස්වීම් විස්තර කර, ඒවාට බලපෑ හේතු** නිදසුන් සපයමින් පැහැදිලි කරන්න.
(අ) ජන විද්‍යාත්මක ලක්ෂණ
(ආ) රැකියා ව්‍යුහය
(ඉ) භූමි පරිභෝග රටාව (ලකුණු 09 යි.)

[ අටවෙනි පිටුව බලන්න.


6. (i) **වගු අංක 3 හි සහ රූප සටහන් අංක 2 හි** සපයා ඇති තොරතුරු ප්‍රයෝජනයට ගනිමින් පහත දක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**වගු අංක 3**
**2008 වර්ෂයේ තෝරාගත් රටවල ඉන්ධන පරිභෝජනය**

| රට | ඉන්ධන වර්ගය<br>ඛනිජ තෙල්, ස්වාභාවික ගෑස්, ගල් අඟුරු, න්‍යෂ්ටික බලය<br>(මිනුම් ඒකකය : ඛනිජතෙල් මිලියන ටොන් ලෙසින්) |
|---|---|
| ඇමෙරිකා එක්සත් ජනපදය | 2242.3 |
| රුසියානු සමූහාණ්ඩුව | 646.8 |
| ජර්මනිය | 306.7 |
| චීනය | 1870.1 |
| ඉන්දියාව | 491.8 |
| දකුණු කොරියාව | 239.2 |
| බංග්ලාදේශය | 20.6 |
| බ්‍රසීලය | 22.4 |
| ඊජිප්තුව | 70.4 |

මූලාශ්‍රය : *BP Statistical Review of World Energy, 2009*

**අංක 2 රූප සටහන**
**කලාප අනුව ලෝක බලශක්ති පරිභෝජනය, 1970 - 2020**




* **සැ. යු.** Quadrillion (ක්වොඩ්රිලියන්) 1 = බොරතෙල් බැරල් මිලියන 170; BTU = බ්‍රිතාන්‍ය තාප ඒකකය

මූලාශ්‍රය : Adapted from EIA, International Energy Outlook, 2000

(i) 2008 වර්ෂයේ දී, තෝරාගත් සංවර්ධිත හා සංවර්ධනය වන රටවල **ඉන්ධන** පරිභෝජනයේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** දක්වන්න. *(ලකුණු 03 යි.)*

(ii) 1970 සිට 2020 අතර කාලසීමාවේ සංවර්ධිත හා සංවර්ධනය වන රටවල **බලශක්ති** පරිභෝජන රටාවේ **පවතින හා ප්‍රක්ෂේපිත** වෙනස්කම් වලට හේතු විභාග කරන්න. *(ලකුණු 06 යි.)*

(iii) ප්‍රතිජනක බලශක්ති මූලයන් භාවිත කිරීමෙන් සංවර්ධනය වන රටවලට ලැබෙන වාසි පහත දක්වෙන මාතෘකා යටතේ පැහැදිලි කරන්න.

(අ) පාරිසරික වාසි
(ආ) ආර්ථික වාසි
(ඉ) සමාජයීය වාසි

*(ලකුණු 06 යි.)*

7. (i) සපයා ඇති ලෝක සිතියමෙහි විශාඛපත්තනම්, නාගසාකි, ෂැංහයි, ක්ලයිඩ්සයිඩ්, උල්සාන්, නිව්පෝට් නිව්ස් යන නැව් තැනීමේ මධ්‍යස්ථාන ලකුණු කර ඇත. මෙම මධ්‍යස්ථාන නිවැරදිව නම් කරන්න. *(ලකුණු 03 යි.)*

(ii) **එක්කෝ** එක්සත් රාජධානියේ **නැතහොත්** ජපානයේ නැව් කර්මාන්තයෙහි **වර්ධනයට සහ එහි වර්තමාන තත්ත්වයට** දායකවන සාධක සාකච්ඡා කරන්න. *(ලකුණු 08 යි.)*

(iii) **එක්කෝ** දකුණු කොරියාව **නැතහොත්** චීනය වර්තමානයේ ප්‍රධාන නැව් තැනීමේ රාජ්‍යයක් වශයෙන් පෙරමුණ ගැනීමට හේතු වූ සාධක පැහැදිලි කරන්න. *(ලකුණු 04 යි.)*

8. (i) පසුගිය දශක දෙක තුළ, ජාත්‍යන්තර වෙළෙඳ පොළෙහි ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදනවල වෙළෙඳාම සම්බන්ධයෙන් පිළිබිඹුවන කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** සාකච්ඡා කරන්න. *(ලකුණු 06 යි.)*

(ii) "ලෝක වෙළෙඳාමේ දී කාර්මික නිෂ්පාදන පිළිබඳ ව දියුණු රටවල තරඟකාරී ශක්තිය අඛණ්ඩව පවත්වා ගැනීමේදී ප්‍රධාන ගැටලු ඇති වී තිබේ" (Ehrlich and Ehrlich, 1990). මෙම ලක්ෂණයට අදාළ ගැටලු **තුනක්** හඳුනාගෙන නිශ්චිත උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න. *(ලකුණු 09 යි.)*

* * *

25851

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


**22 | III**

ප්‍රශ්න අංකය
வினா இல
**Question No.** } 2

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2010**

භූගෝල විද්‍යාව III (මානුෂ භූගෝල විද්‍යාව) (II කොටස)
புவியியல் III (மானிடப் புவியியல்) (பகுதி II)
**Geography III (Human Geography) (Part II)**

විභාග අංකය
சுட்டெண்
**Index No.** } ..............................



සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

22 III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2010


| | | | |
|---|---|---|---|
| භූගෝල විද්‍යාව | III | (මානුෂ භූගෝල විද්‍යාව) | (II කොටස) |
| புவியியல் | III | (மானிடப் புவியியல்) | (பகுதி II) |
| **Geography** | III | (Human Geography) | (Part II) |

ප්‍රශ්න අංකය / வினா இல / **Question No.** 4

විභාග අංකය / சுட்டெண் / **Index No.** ..............................

සිතියම් අංක 1 - படம் 1 - Map 1

මහවැලි සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශ
மகாவலி அபிவிருத்திச் செயற்றிட்டப் பிரதேசம்
**MAHAWELI DEVELOPMENT PROJECT AREA**



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**22 | III**

ප්‍රශ්න අංකය
வினா இல
**Question No.** 7

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2010 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2010 ஓகஸ்ற்
**General Certificate of Education (Adv. Level) Examination, August 2010**

භූගෝල විද්‍යාව III (මානුෂ භූගෝල විද්‍යාව) (II කොටස)
புவியியல் III (மானிடப் புவியியல்) (பகுதி II)
**Geography III (Human Geography) (Part II)**

විභාග අංකය
சுட்டெண்
**Index No.** ..............................

